# අකුරැස්ස ප්‍රාදේශීය සභාව

## 2026 වර්ෂය සඳහා සේවකයින් ලියාපදිංචි කිරීම

දකුණු පළාතේ, අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සේවා අවශ්‍යතාවය මත 2026.01.01 දින සිට 2026.12.31 දින දක්වා ලියාපදිංචි කර සේවය ලබා ගැනීම සඳහා පහත සඳහන් තනතුරු වෙනුවෙන් සුදුසුකම් සපුරාලන දකුණු පළාත තුළ ස්ථිර පදිංචි කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | වැටුප් පරිමාණය | ලියාපදිංචි කර ගැනීමට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | පොදු සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | බර යන්ත්‍ර ක්‍රියාකරු | සේවය කරනු ලබන දිනවලට අදාළව සභාව මගින් තීරණය කරනු ලබන වැටුප් ගෙවනු ලැබේ | - අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල විෂයයන් හය (06) ක් සමත් වී තිබීම හෝ 5 ශ්‍රේණිය (6 වසර) සමත්ව තිබීම හා බර යන්ත්‍ර උපකරණ ක්‍රියා කිරීම පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් NVQ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම<br>- යන්ත්‍රෝපකරණ වර්ගය ක්‍රියාකරවීම හා පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබීම. මේ සඳහා 2009 අංක 08 දරන මෝටර් රථ ප්‍රවාහන පනතේ 122 වගන්තියේ සඳහන් CE හෝ DE කාණ්ඩයේ බලපත්‍රයක් ලබා තිබීම අනිවාර්ය නොවන අතර J කාණ්ඩයේ බලපත්‍රයක් ලබා තිබීම අනිවාර්ය වේ. තව ද එකී පනතේ සඳහන් කරුණු හා ඒ සම්බන්ධව ඉදිරියේදී සිදු කරනු ලබන සංශෝධනයන්ට යටත් වනු ඇත. | - ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.<br>- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.<br>- අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචි කරුවකු විය යුතුය.පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර, නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය.<br>- තනතුරට ලියාපදිංචි කර ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. |
| 02 | සෞඛ්‍ය කම්කරු | සේවය කරනු ලබන දිනවලට අදාළව සභාව මගින් තීරණය කරනු ලබන වැටුප් ගෙවනු ලැබේ | 8 වන ශ්‍රේණිය (09 වසර සමත්ව තිබීම) | |
| 03 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | සේවය කරනු ලබන දිනවලට අදාළව සභාව මගින් තීරණය කරනු ලබන වැටුප් ගෙවනු ලැබේ | 8 වන ශ්‍රේණිය (09 වසර සමත්ව තිබීම) | |

CamScanner

**වෙනත්:**

1. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.
2. අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවකු කරනු ලැබුවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබුවකු නොවිය යුතුය.
3. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරු කාල සීමාවේදී හෝ මෙම ලියාපදිංචි කිරීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සතුය.

**සේවාව ලබා ගැනීමේ ක්‍රමය:**

1. සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරා ගනු ලැබේ.
2. නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි:**

1. මෙය 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19(1) (i) වගන්තිය යටතේ බඳවා ගැනීමක් නොවන අතර , බාහිර සැපයුම්කරුවකු/පාර්ශවකරුවකු මඟින් සේවාවක් ලබා ගැනීමකි.

**ඉල්ලුම් කරන ආකාරය :**

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත් අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පත් 2026 පෙබරවාරි මස 10 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "සභාපති", අකුරැස්ස ප්‍රාදේශීය සභාව, අකුරැස්ස යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතික
3. පදිංචිය සහතික කිරීම පිණිස මෑතකදී ලබා ගත් ග්‍රාම නිලධාරී සහතිකය
4. මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක්
5. පළපුරුද්ද පිළිබඳ සහතික

සමන් කුමාර සුරවීර,
සභාපති,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව.

සමන් කුමාර සුරවීර
සභාපති
අකුරැස්ස ප්‍රාදේශීය සභාව

2026 ක් වූ ජනවාරි මස 28 දින,
ප්‍රාදේශීය සභාව, අකුරැස්ස.

## අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ පවතින තනතුරු සඳහා ලියාපදිංචි කිරීම - 2026

අයදුම් කරන තනතුරට ඉදිරියෙන් √ ලකුණ යොදන්න.

| | | |
|---|---|---|
| 1 | බර යන්ත්‍ර ක්‍රියාකරු | |
| 2 | සෞඛ්‍ය කම්කරු | |
| 3 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | |

1. මුලකුරු සමඟ නම :- ....................................
2. මුලකුරු වලින් හැඳින්වෙන නම :- ....................................
3. ස්ථිර ලිපිනය :- ....................................
4. තාවකාලික ලිපිනය :- ....................................
5. දුරකතන අංකය : ස්ථාවර :- ......... ජංගම:- .............
6. හැඳුනුම්පත් අංකය :- ..........................
7. උපන් දිනය :- වර්ෂය :- ....... මාසය :- ......... දිනය:- ......
8. අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස : අවුරුදු :......... මාස :........ දින :........
9. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී :.......... පුරුෂ: ..........
10. විවාහක/අවිවාහක බව :- ..........................
11. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ.පො.ස.(උ.පෙළ) විභාග ප්‍රතිඵල :

විභාග අංකය :- .......................... විභාගයට පෙනී සිටි වර්ෂය :- .........................

| විෂයය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

(ආ) අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵල :

විභාග අංකය :- .......................... විභාගයට පෙනී සිටි වර්ෂය :- .........................

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

12. වෘත්තීය සුදුසුකම් :

I. ....................................................................................

II. ....................................................................................

13. පළපුරුද්ද :

I. ....................................................................................

II. ....................................................................................

III. ....................................................................................

CS CamScanner

14. ඔබ සාපරාධි වරදක් සම්බන්ධයෙන් අධිකරණයකවරදකරුවකු වී ඇත් ද ?.............

**අයදුම්කරුගේ සහතිකය**

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවරදි බව සහතික කරමි.මෙම තොරතුරු අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සෙක් වන බවත්,පත් කිරීමෙන් පසු අසත්‍ය හෝ වැරදි බවඅනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මා දනිමි.

......................... ..........................

දිනය අයදුම්කරුගේ අත්සන